*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 237-249*
*ISSN 1800-1459*

# චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සම්බන්ධතා හා දේශපාලන බලපෑම: ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය ඇසුරෙනි

**එස්. නිමාලි ප්‍රියංගිකා**

නූතන භාෂා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාව පෙරදිග හා බටහිර යා කරන නාවික මාර්ගයේ පිහිටි දිවයිනක් වූ බැවින් අතීතයේ සිට ම ලෝක ශිෂ්ටාචාරයන් සමඟ අන්තර් සබඳතා පැවැත්විය. චීන සහයෝගීතාව ඉන් වැදගත් ස්ථානයක් හිමිකර ගත්තේ අතීතයේ සිට ම දේශපාලන හා සංස්කෘතික වශයෙනුත් ලංකාව චීනය සමඟ සෘජු සබඳතාවක් පැවැත් වූ නිසා ය. ක්‍රි.ව. 14 සහ 15 වන සියවස තුළ ශ්‍රී ලංකාවේ දේශපාලනයට චීන රාජ්‍යයෙන් වූ සෘජු බලපෑම පිළිබඳ ව විස්තරාත්මක විශ්ලේෂණයක් මෙම අධ්‍යයනය මඟින් සිදු කෙරේ. ඒ සඳහා ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය පාදක කරගෙන ඇත. මූලික ව ම ද්විතීයික දත්ත පදනම් කරගෙන දත්ත හා තොරතුරු රැස් කිරීම සිදු කර ඇති අතර අධ්‍යයනය කොටස් කිහිපයකින් සමන්විත වේ. හැඳින්වීමේ දී අතීතයේ චීන ශ්‍රී ලංකා සහයෝගිතා පසුබිම පිළිබඳ ව සාකච්ඡා කෙරෙන අතර ප්‍රධාන අරමුණ වූයේ අතීතයේ ලංකාවේ දේශපාලනයට චීන අධිරාජ්‍යය මැදිහත් වීම පිළිබඳ විමර්ශනය කිරීම යි. අනතුරු ව ගම්පොල, රයිගම හා කෝට්ටේ දේශපාලනයට චීන අධිරාජ්‍යය බලපෑම් ඇති කිරීම මධ්‍ය කොටසින් සාකච්ඡා කෙරේ. මෙහි ත්‍රෛභාෂා සෙල්ලිපිය පිළිබඳ විශ්ලේෂණාත්මක විස්තරයක් කෙරෙන අතර වර්තමානයේ දෙරට අතර ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ ව ද මෙම කොටසින් කරුණු විමර්ශනය කෙරේ. ඒ අනුව චීන අධිරාජ්‍යයේ බලපෑමෙන් ලංකාවේ එකල තිබූ අස්ථාවර දේශපාලනය නිමා කරමින් හා ලාංකික රජවරුන්ගේ බලය තහවුරු කරමින් ස්ථාවර දේශපාලන පසුබිමක් නිර්මාණය වූ බව අනාවරණය කෙරේ.

**කේන්ද්‍රීය වචන:** ත්‍රෛභාෂා සෙල්ලිපිය, දේශපාලන බලපෑම, සහයෝගීතාව, දේශපාලන අස්ථාවරත්වය, අන්තර් සබඳතා

## හැඳින්වීම

චීනය සහ ශ්‍රී ලංකාව අතර ඈත අතීතයේ සිට ම කලාපීය වශයෙන් ඉතා සමීප සම්බන්ධතාවක් පැවතුණි. මෙම මිත්‍ර සබඳතාව ක්‍රි.ව. 1 වන සියවස තරම් ඈත අතීතයකට දිවයයි. ප්‍රධාන වශයෙන් දෙරට අතර දේශපාලනික හා වෙළඳ ක්ෂේත්‍රයන් හරහා පුළුල් සහයෝගීතාවක් තිබුණ (රෝහණදීර, 1995:151-167). ඈත අතීතයේ සිට ම පෙරදිග හා බටහිර යා කරන නාවික මාර්ගයේ පිහිටි ශෝභා සෞන්දර්යයෙන් අනූන, ස්වාභාවික වරායන් වටකරගත් ලංකාව ලොව අනෙකුත් ශිෂ්ටාචාරයන් සමග මේ ආකාරයට විවිධ සබඳතා පැවැත්විය. ඒ අතුරින් චීනය වැදගත් තැනක් හිමිකර ගනී. ක්‍රි.ව 1 වන සියවසත් 5 වන සියවසත් අතර කාලය තුළ චීන ශ්‍රී ලංකා මිත්‍රත්ව සහයෝගීතාව තහවුරු කරන සාධක බොහෝ ය (Peris 2008). සෞන්දර්යාත්මක සීගිරි ලලනාවන් චීන මොන්ගෝලියානු අංග ලක්ෂණයන් දරා සිටිනුයේ ද මෙම හේතුවෙන් යැයි අනුමාන කළ හැකි ය (Peris 2008). මහානාම රජ දවස දේශාටකයෙක් ලෙස

ශ්‍රී ලංකාවට පැමිණි ෆාහියන් භික්ෂුව ක්‍රි.ව. 413 දී ටිබෙට් සානුව හිමාලය කඳුවැටිය හා ඉන්දු ගඟ තරණය කරමින් ශ්‍රී ලංකාවට පැමිණීමේ මූලික අරමුණ වූයේ බෞද්ධ මූල ග්‍රන්ථ සහ සූත්‍ර පිළිබඳ ව සොයා බැලීම ය. ඔහුගේ වාර්තාවට අනුව වරක් අනුරාධපුරයේ බුද්ධ ප්‍රතිමාවකට චීන වෙළෙන්දෙකු විසින් සිල්ක්වලින් නිමකරන ලද අවානක් පූජා කරනු දක ගැනීමට ලැබී ඇත. මෙම කාලය වන විට චීන ජාතිකයින් විසින් ශ්‍රී ලංකාව "සිංහරට" ලෙස හඳුන්වා ඇත. සමකාලීන චීන වාර්තාවන්ට අනුව මෙකල චීන වෙළඳුන් විසින් මාන්තොට වරාය හරහා පර්සියානු නැව් භාවිත කරමින් මැණික්, කුළුබඩු හා ඇත්දත් මිලදී ගෙන ඇත. චීන කැටයම්කරුවන් විසින් ඇත් දත් මත සිදු කරන කැටයම නිසා මෙකල ඇත් දත් චීන වෙළඳුන් හට ඉතා වටිනා භාණ්ඩයක්ව තිබී ඇත. චීන ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මේ ආකාරයට මහානාම රජු දවස ආරම්භ වීමෙන් පසුව මේ දක්වා ම ඉතා සවිමත් සබැඳියාවකින් දෙරට අතර සහයෝගීතාව තහවුරු කරගනිමින් සිටී.

## සාහිත්‍ය විමර්ශනය

අතීතයේ ශ්‍රී ලංකාව තුළ චීන අධිරාජ්‍යය විවිධ අයුරින් සහයෝගී සබඳතා පැවැත්වීම සම්බන්ධයෙන් විවිධ පොතපත සාහිත්‍යය තුළ සඳහන් වුව ද ඍජු වශයෙන් ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය ප්‍රධාන කරගෙන ලියවුනු ලිපි දක්නට නො ලැබේ. එ නමුදු වෙන් වෙන් වශයෙන් ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය පිළිබඳවත්, ක්‍රි.ව 14,15 සියවස තුළ චීන අධිරාජ්‍යය ලංකාව සමඟ පැවැත් වූ දේශපාලන සබඳතා පිළිබඳවත් විවිධ කතෘවරුන් විසින් තොරතුරු විශ්ලේෂණය කර ඇත.

ඇස්. පරණවිතාන මහතා ලංකා විශ්වවිද්‍යාලයේ **ලංකා ඉතිහාසය** ග්‍රන්ථයෙහි ක්‍රි.ව. 14, 15 සියවස තුළ ලංකා ඉතිහාසයේ සිදු වූ චීන සබඳතා ඉතා සවිස්තරාත්මක ව විස්තර කර ඇත. එහි **චෙංහෝ** සෙන්පතියා සහ වීර අලකේශ්වර අතර සිදු වූ සිද්ධීන් පැහැදිලි ව විස්තර කර ඇත. **චෙංහෝ** සෙන්පතියාගේ පළමු ලංකා ගමනේ සිට දෙවන ලංකා ගමන දක්වා සිදුවූ සියලු සිද්ධීන් එහි වාර්තා කර ඇත. එසේම කේ. ඩී. පරණවිතාන මහතා ගාලු පුරාණයෙහි ත්‍රෛභාෂා සෙල්ලිපිය පිළිබඳ ව විස්තර ඉදිරිපත් කර ඇත. 1911 දී ගාල්ලේ ක්‍රිප්ස් පාරේ බෝක්කුවකට සවිකර තිබිය දී මෙම සෙල්ලිපිය සොයා ගත් බවත් මිං පෙළපතේ මහාධිරාජ්‍යයා **යුං ලෝ** ගේ නියමය පරිදි නෙලා එවන ලද්දක් යැයි සලකන බව ඔහුගේ අදහසයි. **චෙංහෝ**ගේ ලංකා ගමන පිළිබඳ කෙටි විස්තරයක් ද පරණවිතාන මහතා ගාලු පුරාණය තුළ සඳහන් කර ඇත. ඇකිරියගල එච්. ඒ. ඒකනා ` මහතා අපේ ශිෂ්ටාචාරය 4 කෝට්ටේ යුගය නම් ග්‍රන්ථය තුළ ද **චෙංහෝ** සෙන්පතියා විසින් වීර අලකේශ්වර චීනයට අල්ලා ගෙන ගිය පුවත කෙටියෙන් විස්තර කර ඇත. එසේම ක්‍රි.ව. 1436, 1445, 1459 වර්ෂවල දී පරාක්‍රමබාහු රජු චීනයට දූත පිරිස් යවා රාජතාන්ත්‍රික සබඳතා තර කරගත් බව ද සඳහන් කරේ. එස්. අයි. ගමගේ විසින් රචිත කෝට්ටේ යුගය - දේශපාලන, සමාජ හා සංස්කෘතික පසුබිම ග්‍රන්ථයෙහි ත්‍රෛභාෂා සෙල්ලිපිය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් ඉදිරිපත් කර ඇත. එය චීන, පර්සි, දෙමළ භාෂාවලින් ස්ථාපිත කර ඇති බව සඳහන් කරයි. වී.ඩී.එන්.එස්. ගුණවර්ධන මහත්මිය විසින්

රචිත සෙල්ලිපිවලින් හෙළි කරන ශ්‍රී ලංකා ඉතිහාසයෙහි වීර අලකේශ්වර චීනයට අල්ලාගෙන ගිය පුවත පිළිබඳවත් සෙල්ලිපිය පිළිබඳවත් විස්තර දක්වා ඇත.

ඉහත විස්තර අනුව ලංකා ඉතිහාසය තුළ චීන රාජ්‍යයේ වරින් වර මැදිහත් වීම සහ ත්‍රෛභාෂා සෙල්ලිපිය පිළිබඳ ව විවිධ කර්තෘවරුන් විසින් විශ්ලේෂණය කර ඇති බව පැහැදිලි වේ.

## පර්යේෂණ ගැටලුව

ක්‍රි.ව 14, 15 සියවස තුළ ලංකාවේ දේශපාලනයට චීන රාජ්‍යයෙන් ඍජු බලපෑමක් සිදුවී ද? යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවයි. එසේ බලපෑමක් සිදුවුවා නම් එය කෙසේ සිදුවුව ද?, ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය සහ චීන රාජ්‍යය අතර සබඳතාව කෙබදු ද?, වර්තමානයේ චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා කෙබදු ද? යන සෙසු ගැටලු උදෙසා ද කරුණු විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ.

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ අතීතයේ ලංකාවේ දේශපාලනයට චීන රාජ්‍යයෙන් වුණ ඍජු බලපෑම පිළිබඳ ව විමර්ශනය කිරීම ය. ඒ අනුව ක්‍රි.ව. 14 හා 15 වන සියවස තුළ ලංකාවේ දේශපාලන ස්ථාවරත්වයට චීන රාජ්‍යය විවිධ අවස්ථාවලදී මැදිහත් වූ ආකාරය සහ චීනයේ බල ව්‍යාප්තිය දේශපාලනය මගින් ඉස්මතු වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු වේ. ඒ අනුව චීනයේ ඍජු බලපෑමෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවර දේශපාලන පසුබිමක් නිර්මාණය වූ ආකාරය පිළිබඳ ව කරුණු සාකච්ඡා කෙරේ. එසේ ම දෙරට අතර වත්මන් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳ ව ද කරුණු විමර්ශනය කෙරේ.

## පර්යේෂණයේ වැදගත්කම

ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය මූලික කරගෙන ක්‍රි.ව 14 සහ 15 සියවස තුළ ලංකාවේ දේශපාලනයට චීන රාජ්‍යය විසින් සිදුකළ බලපෑම පිළිබඳ ව ඍජුවම විස්තර කෙරෙන ලිපි සොයා ගැනීම වර්තමානයේ චීන භාෂාව විෂයක් ලෙස හදාරන ලාංකික සිසුනට අපහසු කාර්යයක් වන හෙයින් මේ පිළිබඳ ව අධ්‍යයනය කිරීම වැදගත් කාර්‍යයකි. ලංකා ඉතිහාසය පිළිබඳ ව අධ්‍යයනය කරන අයට ද ඒ සඳහා ඇල්මක් දක්වන අයට ද මෙම පර්යේෂණ ලිපිය තුළින් කරුණු රාශියක් විමර්ශනය කර ගත හැකිය. වර්තමානයේ චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා ඉතා ශක්තිමත් ව වර්ධනය වන ආකාරය හමුවේ අතීතයේ සිට ම දෙරට අතර පැවති දේශපාලන, සංස්කෘතික යන සෑම අංශයක ම සබඳතාව පිළිබඳ ව කරුණු අධ්‍යයනය වර්තමානයේ අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. මේ නිසා මෙම පර්යේෂණය චීන භාෂාව හදාරන්නන්ට, ඉතිහාසය පිළිබඳ ව අධ්‍යයනය කරන්නන්ට ඉතා වැදගත් වනු ඇත.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 237-249
ISSN 1800-1459

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගත හැකිවන පරිදි දත්ත හා තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය සිදු කිරීම කරන ලදී. දත්ත හා තොරතුරු රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ද්විතීයික දත්ත මත පදනම් වන අතර ඒ සඳහා පොත්පත්, පුවත්පත්, පර්යේෂණ ග්‍රන්ථ, රජයේ ප්‍රකාශන, විමර්ශිත සඟරා සහ අන්තර්ජාලය පරිශීලනය කරන ලදී.

## සාකච්ඡාව

### චීන සබඳතාවල ඓතිහාසික ආරම්භය

චීන ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳ ව සැලකීමේ දී මුල් ම සාක්ෂ්‍ය ලැබෙන්නේ ෆාහියන් භික්ෂුවගේ ලංකා ගමනේදී ය. එකල මෙරට රජ කළේ මහානාම රජු ය. ඓතිහාසික මූලාශ්‍රය අනුව මහානාම රජු විසින් එවක සිටි චීන අධිරාජ්‍යයා වෙත ලිපියක් ලියමින් ශ්‍රී ලංකාව චීනයේ සංවර්ධන කටයුතු පිළිබඳ ව මනා අවබෝධයකින් සිටින බව දැනුම්දී ඇත (Peris 2008). එසේම ක්‍රි.ව. 456 දී ධාතුසේන රජතුමා ද චීන අධිරාජ්‍යයා වෙත සංදේශයක් යැවූ බව සඳහන් වේ (Peris 2008). ඒ අනුව ධාතුසේන කුමරු විසින් සිය රාජාභිෂේකයේ දී චීන අධිරාජ්‍යයා වෙත සංදේශයක් යවමින් තමා චීනයේ සංචාරයට ඉතා කැමැත්තෙන් පසුවන බව දැනුම් දී තිබේ (Peris 2008). ඉන්පසුව 1 වන ගජබා රජ දවස හා 4 වන අග්බෝ රජ දවස චීන ශ්‍රී ලංකා රාජ තාන්ත්‍රික සබඳතා වඩා වර්ධනය වී තිබේ (Peris 2008). ක්‍රි.ව. 976-1265 අතර කාලය තුළ චීනයේ සිටි සියලු අධිරාජ්‍යයන්ට අයත් කාසි ශ්‍රී ලංකාවෙන් සොයා ගැනීමෙන් මේ බව තහවුරු වේ (Peris 2008). ක්‍රි.ව. 13-14 යන සියවස්වල චීනයට බොහෝ රාජ දූතයන් යවන ලද බව ද මූලාශ්‍රයවල සඳහන් ය (Peris 2008). චීන වාර්තාවන්ට අනුව ක්‍රි.ව. 1284 දී මාරවර්මන කුලසේකර (1268-1310) පාණ්ඩ්‍ය රජු ශ්‍රී ලංකාවේ තිබී පැහැරගෙන යන ලද දන්ත ධාතුව නැවත ලබා ගැනීමට ද චීන අධිරාජ්‍යයන් විසින් උපකාර කර ඇත (Peris 2008). එසේ ම කාව්‍යශේඛරයට අනුව 3 වන පරාක්‍රමබාහු (1287-1293) රජ දවස ශ්‍රී ලංකා හමුදාව තුළ චීන සොල්දාදුවන් විශාල පිරිසක් සිටි බවට අනාවරණය වී ඇත (Peris 2008).

### ගම්පොළ, රයිගම හා කෝට්ටේ දේශපාලනයට චීන අධිරාජ්‍ය මැදිහත් වීම

පස්වන බුවනෙකබාහු ඇවෑමෙන් වීරබාහු 1391 දී ගම්පොළ රජ විය. වීරබාහු රජු මෙසේ ගම්පොළ සිට පාලන කටයුතුවල නියැළී සිටිය දී ඔහුගේ සහෝදර එකොළොස් වන අලකේශ්වර එම රජුගේ ආධිපත්‍ය නොපිළිගත් අතර ඔහු රයිගම මූලස්ථානය කරගෙන පහතරට ප්‍රදේශ පාලනය කිරීම ආරම්භ කළේ ය. මේ තත්ත්වය යටතේ ඉන් පසුව වීරබාහු හා අලකේශ්වර අතර සටනින් වීරබාහු මියගොස් ඇත. මෙය සිදුව ඇත්තේ ක්‍රි.ව. 1409 වර්ෂයේ දී ය. සද්ධර්මරත්නාකරය මේ අලකේශ්වර හඳුන්වා ඇත්තේ වීර අලකේශ්වර යනුවෙනි. වීර අලකේශ්වර මෙසේ ජයග්‍රාහී ව රයිගම පාලකයා වශයෙන් පෙනී සිටිය ද

ISSN 1800-1459

ගම්පොළ සේනාලංකාධිකාර කුමාරයන් ප්‍රමුඛ කන්ද උඩ පස් රටේ ප්‍රධානීන් ඔහුගේ ආධිපත්‍යය පිළිගෙන නැත. ඔවුන් වීරබාහු රජු ඇවෑමෙන් එම රජුගේ ද ගම්පොළ සේනාලංකාධිකාරයන්ගේ ද මුණුබුරෙකු වූ කුමාරයකුට පරාක්‍රමබාහු යැයි නම් තබා 1410 දී සෙංකඩගල රජ කරවූ බව අස්ගිරි තල්පත සඳහන් කරයි.

මෙසේ ගම්පොළ එක් පාලකයෙකු ද රයිගම තවත් පාලකයකු ද සිටි වකවානුවේ චීන අධිරාජ්‍යය ප්‍රථම වරට මෙරට දේශපාලන කටයුතුවලට මැදිහත් වූ බව පෙනේ. මේ වකවානුවේ චීනයේ සිංහාසනාරූඪ වූ **චෙං සූ** හෙවත් **යුං ලෝ** නමැති තුන්වෙනි **මිං** අධිරාජ තෙමේ ස්වකීය අන්තඃපුර මුර සේවයේ යොදවා සිටි අති විශ්වාසනීය නපුංසක සෙන්පතියෙකු වූ **චෙංහෝ** නමැත්තා යටතේ විශාල නාවුක හමුදාවක් එනම් නැව් හැටක් පමණ ඉන්දියානු සාගර කලාපයට පිටත් කර හැරියේය (පරණවිතාන,1971: 616). එම කලාපයේ රට රාජ්‍යවල ස්වකීය අධිරාජ බලය හැඟවීම චීන අධිරාජ්‍යයාගේ ප්‍රධාන අරමුණ වන්නට ඇත. අවුරුදු තිහක දී සත්වරක් දකුණු දෙස රටවලට යාත්‍රා කළ **චෙංහෝ** සමහර අවස්ථාවල අරාබියට පවා ගියේ ය. මොහු සුමාත්‍රාව, මලයාව පසුකර ඉන්දියන් සාගරයට පිවිස දකුණු ඉන්දියාවේ තොටුපොළ හරහා යාත්‍රා කරද්දී 1405 දී ලංකාවට ගොඩ බැස්සේ ය. එවිට වීර අලකේශ්වර තෙමේ ඔහුට සිය විරුද්ධත්වය දැක්වී ය. තත්ත්වය දැනගත් චීන නෞකා සේනාපති තෙමේ පිටත් ව ගියේ ය (පරණවිතාන,1971: 617). වීර අලකේශ්වර හොඳ රජ කෙනෙකු යැයි සිංහල පොත්පත්වල කිසි තැනක සඳහන් කර නොමැති බැවින් ඔහුගේ චරිතය ගැන චීනුන් තුළ පැවති අදහස වැරදි එකක් යැයි සිතිය නො හැකි ය. මලණුවන් වූ වීරබාහු කුමාරයා නෙරපා දමන ලදුව කලක් තිස්සේ බලයෙන් හා තත්ත්වයෙන් පිරිහී සිටි වීර අලකේශ්වර, බුද්ධාගමට බෙහෙවින් උදව් කළ තම තරහකාරයාගේ ප්‍රතිපත්තියට පටහැණි ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. බුද්ධ ධර්මයට ගෞරව කිරීමටත් මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අතහැර දැමීමටත් වීර අලකේශ්වරයන් පෙළඹීමට චීනුන් වැයම් කළ බව ඔවුන්ගේ පොත පතෙහි සඳහන් ය (පරණවිතාන,1971: 617). එහෙත් සිංහල මහ තෙරවරුන්ට පවා නොහැකි වූ මෙම කටයුත්ත චීන ජාතික නපුංසකයෙකුට කළ හැකි යයි සිතිය නොහැකි ය. **චෙංහෝ** පළමුවැනි වරට ලංකාවට පැමිණියේ දන්ත ධාතුවක් ලබා ගැනීමට යයි චීන පොත්පත්වල සඳහන් වෙයි (පරණවිතාන,1971: 617).

**චෙංහෝ** නැවත වරක් 1409 දී ලංකාවට පැමිණියේ ය. චීන වාර්තාවලට අනුව මෙවර ඔහු පැමිණ ඇත්තේ මෙරට රජු හා ජන නායකයන්ට තුඩු පඬුරු ද බුදුන් වහන්සේට හා ශ්‍රේෂ්ඨ පූජනීය ස්ථානයකට පුද පඬුරු ද රැගෙන ය. වීර අලකේශ්වර එම අවස්ථාවේ දී ද නිසි අයුරින් සෙන්පතියා පිළි නොගැනීම නිසා සෙන්පතියා දකුණ බලා යාත්‍රා කර තමන් ගෙන ආ පුද පඬුරු දෙවුන්දර උපුල්වන් දේවාලයට පූජා කර චීන, පර්සියානු හා දෙමළ යන භාෂා තුනෙන් සෙල්ලිපියක් පිහිටුවා ආපසු ගියේ ය (රෝහණදීර,1995:71). ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය නමින් ප්‍රකට වූයේ මෙම සෙල්ලිපිය යි. මෙම සෙල්ලිපිය පිළිබඳ ව විශ්ලේෂණාත්මක තොරතුරු පර්යේෂණ පත්‍රිකාවේ මධ්‍ය කොටසෙහි සාකච්ඡා කෙරේ.

ඉන්පසුව ඔහු නැවත 1411 දී විශාල නැව් හමුදාවක් සමග ලංකාවට පැමිණියේ ය. මේ අවස්ථාවේ දී ද වීර අලකේශ්වර ඔහුට විරුද්ධ වී ඇත. චීන මූලාශ්‍රයවලට අනුව හෙතෙම 50,000 ක බළ ඇණියක් සූදානම් කර **චෙංහෝ** සෙන්පතියාගේ

ගමන වළකනු පිණිස ගස් කපා හෙළා මාර්ගය ඇහිරීමටත් **චෙංහෝගේ** නැව් විනාශ කිරීමටත් සැලසුම් කර ඇත. නමුත් ඔහුගේ මේ සැළැස්ම පිළිබඳ ව ඔහුගේ හමුදාවෙන් ම ලැබුණු ඔත්තුවක් අනුව වහා ක්‍රියාත්මක වූ **චෙංහෝ** සෙන්පතියා 3000 ක භට පිරිසක් රැගෙන එක් රාත්‍රියක වක්‍ර මාර්ගයකින් නගරයට ඇතුළු විය. එහිදී වීර අලකේශ්වරගේ හමුදාවත් සමග දින හයක් තිස්සේ සටන් කිරීමෙන් පසුව **චෙංහෝ** සෙන්පතියා වීර අලකේශ්වර ද ඔහුගේ පවුලේ නෑයන් ද සිරබාරයට අර ගත්තේ ය. 1411 දී මෙසේ වීර අලකේශ්වර අල්ලාගත හැකි වූයේ ඉහත දැක් වූ පරිදි ඔහුගේ හමුදාවෙන් ලද ඔත්තු නිසා බව චීන වාර්තාවලින් පැහැදිලි වේ. වීර අලකේශ්වර ඇතුළු සිරකරුවෝ 1411 වසරේ ජූලි මාසයේ චීන රාජ සභාව ඉදිරියට පමුණුවන ලදී. සිරකරුවන් මරණයට පත් කරන ලෙස එරට ඇමති මණ්ඩලය උපදෙස් දී තිබේ. නමුත් චීන අධිරාජ්‍යයා ඔවුන් නිදහස් කර ලංකාවේ සිහසුනට සුදුස්සකු නම් කරන ලෙස ලාංකිකයන්ට දන්වා ඇත. ඔවුන් විසින් තෝරා ගන්නා ලද තැනැත්තා **"යෙහ්-පා-නයි-න"** යන නමින් චීන විස්තරයේ සඳහන් වේ. පසුව චීන අධිරාජ්‍යයා **"යෙහ්-පා-නයි-න"** නම් තැනැත්තාට නිල මුද්‍රා බාර දී ශ්‍රී ලංකාවේ තම නියෝජිත රජු ලෙස ප්‍රකාශයට පත් කර සිරකරුවන් පිරිස පෙරළා දිවයිනට එවා තිබේ (පරණවිතාන,1971: 617, 618).

මෙරටින් ගෙන යන ලද සිරකරුවන්ගේ ද අදහස් විමසා චීන අධිරාජ්‍යයා ඉහත සඳහන් තීරණය ගන්නට ඇත්තේ **චෙංහෝ** සෙන්පතියාගේ ද උපදෙස් ඇතිව බව නිසැක ය. චීන අධිරාජ්‍යයාගේ ආධිපත්‍යය පිළිගෙන මෙරට පාලනය සඳහා පත් කළ යුතු තැනැත්තා නිර්දේශ කරන්නට ඇත්තේ වීර අලකේශ්වර අල්ලා ගැනීමට **චෙංහෝ** සෙන්පතියාට රහසින් උදවු කරන්නට ඇතැයි සැලකිය හැකි සෙංකඩගල පරාක්‍රමබාහු විය යුතු ය. සද්ධර්මරත්නාකරය ඔහු හැඳින්වූයේ පරාක්‍රම ඇපාණන් යනුවෙනි. ඒ අනුව චීන අධිරාජ්‍යයා විසින් නම් කරන ලදුව 1412 දී මෙරට පාලනය කරමින් සිටි පරාක්‍රබාහු ඇපා හෙවත් සෙංකඩගල පරාක්‍රමබාහු බව නිගමනය කළ හැකි ය.

මේ කරුණු විශ්ලේෂණය කිරීමේ දී ගම්පොළ, රයිගම හා කෝට්ටේ රාජ්‍ය කාලය තුළ චීන අධිරාජ්‍යය ඍජු දේශපාලනික බලපෑමක් ලංකාවට එල්ල කර ඇත. ලංකාවේ එකල රාජ්‍ය කළ රජවරුන් චීනයට සිරකරුවන් ලෙස ගෙන යෑමෙන් සහ ලංකාවට චීනය යටතේ රජකම් කිරීමට නියෝජිතයෙකු පත් කිරීම මගින් ඒ බව මනා ලෙස පැහැදිලි වේ. ලංකා ඉතිහාසයේ දේශපාලන අස්ථාවරයක් තිබූ අවධියේ චීන රාජ්‍යයෙන් වරින් වර දූත පිරිස් පැමිණ ස්වකීය අධිරාජ්‍යය බලය නැංවීමට උත්සාහ දරා ඇත. එසේ ම මෙහි දී චීන අධිරාජ්‍යයේ බල මහිමය සම්බන්ධයෙන් ලක්වැසියන් තුළ බලවත් හැඟීමක් ජනනය කිරීම ද ඔවුන්ගේ අරමුණ වන්නට ඇත. මේ වකවානුවේ චීන අධිරාජ්‍ය වෙතට වරින් වර කප්පම් පඬුරු යැවූ **පු-ල-කො-ම-බ-ෂෙ-ල-ච** නම් වූ ලංකා රජකු පිළිබඳ චීන ඉතිහාස වාර්තාවල සඳහන් වේ (පරණවිතාන,1971: 630). ඔහු පරාක්‍රමබාහු රජු නමින් හඳුනාගත හැකි අතර 1416, 1421 යන වර්ෂ වලදී පුද පඬුරු රැගෙන චීනයට දූත පිරිස් යවා ඇත. ඉන්පසුව නැවතත් **චෙංහෝ** සෙන්පතියා 1430, 1432 යන වර්ෂවල දී ලංකාවට පැමිණ තිබේ. නැවත වරක් 1433, 1436, 1445 සහ අවසන් වර 1459 යන වර්ෂවල තුටු පඬුරු රැගත් ලංකා

දූත පිරිස් චීන රාජ සභාවට ගොස් ඇත. මේ යුගය පිළිබඳ ව චීන ඉතිහාස ග්‍රන්ථවල ලංකාව පිළිබඳ ව අවසන් වරට සඳහන් වන්නේ 1459 සම්බන්ධයෙනි.

මෙරට දේශපාලන ප්‍රතිපත්තිය ගැන සලකන විට, චීනයට කලින් කල යවන ලද කප්පම නිසා තම රටවැසියන් අතර පරාක්‍රමබාහු රජුගේ ගෞරවය කිසි ලෙසකින් ඌන නොවේ. චීනය පිහිටියේ ලංකාවට ඉතා ඈතිනි. මේ මුහුදුවල චීන යුද සෙනඟ දක්නට ලැබුණේ කලාතුරකිනි. රටේ අභ්‍යන්තර පරිපාලනය සම්බන්ධයෙන් චීන අධිරාජ්‍යයාගේ නියෝජිතයෝ ඇඟිලි නො ගැසූහ. තමන්ට කප්පම් ඔප්පු කළ විදේශික රාජ දූතයන්ට ආපසු ගෙන යනු පිණිස තෑගි දීම චීන රාජ්‍යයේ සාමාන්‍ය සිරිත විය. මේ නිසා චීනයේ දී ''කප්පම'' යනුවෙන් හැඳින්වුණු තෑගි සහිත ව ඉඳහිට දූතයන් යැවීම ආර්ථික හානියක් නොවී ය. චීන අධිරාජ්‍යයා විසින් මෙරටට පෙරළා එවන ලද තෑගි ලංකාවේ රජු කෙරෙහි විදේශික රජුන් දක්වන ගෞරවයේ සලකුණක් යැයි හැඳින්විය හැකි ය. රාජදූතයෝ චීනයේ දී ඒ රාජ සභාවේ සතුටට හේතුවන පරිදි හැසිරීමට සූදානම් ව සිටි අතර ලංකාවේ දී තම රජුගේ ගෞරවයට හානි විය හැකි කිසිවක් මෙරට වැසියන්ට නොකීමට යුහුසුළු වූහ. **චෙංහෝ** විසින් වීර අලකේශ්වර අල්ලා ගනු ලැබීම, චීනයේ බලමහිමය සම්බන්ධයෙන් වැසියන් තුළ බලවත් හැඟීමක් පහළ කිරීමට සමත් වූ බව නිසැක ය. පරාක්‍රමබාහු රජු එවැනි බලවත් ජාතියක් හා මිත්‍ර ව සිටීම ඔහුට එරෙහි වීමට මාන බැලූ සතුරන් මැඩ පැවැත්වීමටත් ඒ නිසා ඔහුගේ තත්ත්වය ශක්තිමත් වීමටත් හේතුවන්නට ඇත. මේ කරුණු පදනම් කොට පරාක්‍රමබාහු රජු තම බලය හා ගෞරවය තහවුරු කර ගත්තේ **චෙංහෝ** ගේ උපකාරයෙන් බව ඓතිහාසික සත්‍යයක් ලෙස පිළිගත හැකි ය. ඉන් පසු ව රජකමෙහි ස්ථාපිත වූ පසු පරාක්‍රමබාහු රජු චීනය සමඟ සබඳකම් පැවැත්වීම ගැන එතරම් උනන්දු නොවීය. මේ නිසා **චෙංහෝ** 1432 දී චීනයේ ''හිතවත් උපදෙස් රැගෙන එන්නා'' සේ නැවතත් එවන ලදී (පරණවිතාන,1971: 632).

ඉන්පසු ව උඩරට පරාක්‍රම ඈපාණන් ඇවැමෙන් රජ වූයේ ඔහු පුත් දැදිගම පරාක්‍රමබාහු ය (රෝහණදීර,1995:75). මොහු ද චීන අධිරාජ්‍යයා සමග සබඳතා පවත්වා ඇත (රෝහණදීර,1995:75). මේ වන විට ජයවර්ධනපුර පරාක්‍රමබාහු රජු දේශපාලන වශයෙන් ද සංස්කෘතික වශයෙන් ද දැදිගම පාලකයාට වඩා බොහෝ සෙයින් ජනප්‍රිය ව සිටියේ ය. මේ තත්ත්වය යටතේ දැදිගම පරාක්‍රමබාහු සීඝ්‍රයෙන් පිරිහෙමින් පැවති තම බලය තහවුරු කර ගැනීම සඳහා චීන අධිරාජ්‍යයාගේ පිළිසරණ පැතී ය (රෝහණදීර 1995:76). මේ වකවානුවේ **චෙංහෝ** සෙන්පතියා විසින් වරින් වර මෙහෙයවන ලද දක්ෂිණ සමුද්‍ර යාත්‍රාවල ප්‍රධාන අරමුණ ව පැවතියේ දක්ෂිණ සමුද්‍ර කලාපීය රටවල් සමග සුහද වෙළඳ සම්බන්ධතා පවත්වා ගැනීම ය (රෝහණදීර 1995:76). ඒ තත්ත්වය යටතේ මෙරට දේශපාලනමය, ආගමික හා වාණිජමය ක්ෂේත්‍රයන්හි ප්‍රබල තත්ත්වයකට පත්ව සිටි ජයවර්ධනපුර පරාක්‍රමබාහු ත් දැදිගම පරාක්‍රමබාහු ත් අතර සමගි සන්ධානයක් ඇති කිරීමට ද චීන අධිරාජ්‍යය උත්සාහ දරා ඇත (රෝහණදීර 1995:76,77). ඉන්පසු ව ජයවර්ධනපුර පරාක්‍රමබාහු රජතුමා දැදිගම රජ පවුල සමග විවාහ සම්බන්ධතාවයක් පැවැත්වීමෙන් පසු දැදිගම පාලකයා හයවන පරාක්‍රමබාහු රජුගේ යුවරාජ පදවියට පත් විය. මෙම ගණුදෙනුව චීනයත් ලංකාවත් අතර පැවති ඔබ මොබ දූත ගමන්වල අවසාන ප්‍රතිඵලය විය (රෝහණදීර 1995:77). චීන අධිරාජ්‍යයාගේ මැදිහත් වීමෙන් දැදිගම පාලකයාත් තමාත් අතර පැවති බල අරගලය සංසිඳුවීම

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 237-249
ISSN 1800-1459

සම්බන්ධයෙන් කෘතගුණ සැලකීමක් ලෙස නැවතත් චීනයට සුහද දූත ගමනක් ජයවර්ධනපුර පරාක්‍රමබාහු රජ විසින් යවන ලදී (රෝහණදීර,1995:77). මේ ආකාරයට කෝට්ටේ යුගය දක්වා ලංකාවේ දේශපාලනයට චීන අධිරාජ්‍යය ඍජු ලෙස සම්බන්ධ වී ඇති බව නිශ්චිතව කරුණු අනාවරණය කරගත හැකි ය.

## ත්‍රෛභාෂා සෙල්ලිපිය


අතීතයේ සිට පැවතගෙන ආ මෙම චීන ශ්‍රී ලංකා සහයෝගීතා තහවුරු කරන පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාධක රාශියක් සොයාගෙන ඇත. ඒ අතුරින් ලංකාවේ දේශපාලනයට ඍජු බලපෑමක් චීනය මගින් එල්ල වූ බවට සනාථ කළ හැකි ප්‍රධානතම සාක්ෂියක් ලෙස ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය හඳුන්වා දිය හැකි ය. මෙය ත්‍රෛභාෂා, ත්‍රිභාෂා යන නම් දෙකින් ම හැඳින්වේ. මෙම අද්විතීය ශිලා ලේඛන පුවරුව දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති අතර මෙය මුලින් ම සොයා ගන්නා ලද්දේ 1911 දීය. එය සොයා ගත්තේ එවක දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයෙකු වූ එච්.එෆ්. ටොමලින් මහතා විසින් ක්‍රිප්ස් පාරේ බෝක්කුවක් අසල තිබිය දී ය. මෙය **චෙංහෝ** සෙනෙවියා විසින් චීන, දෙමළ හා පර්සියානු භාෂා ත්‍රිත්වයෙන් ලේඛන ගත කර ඇත්තේ ක්‍රි.ව. 1409 දීය. **චෙංහෝ** සෙනෙවියා 1409 දී ලංකාවට පැමිණිමේ දී වීර අලකේශ්වර විසින් ඔහුට විරුද්ධ වීම නිසා ඔහු දකුණ බලා යාත්‍රා කර තමන් ගෙන ආ පූද පඬුරු දෙවුන්දර උපුල්වන් දේවාලයට පූජා කර මෙම සෙල්ලිපිය ද පිහිටුවා ගිය බව මූලාශ්‍රයවල සඳහන් ය (රෝහණදීර 1995:71).

චීන, පර්සියානු හා දෙමළ යන භාෂා තුනෙන් සටහන් කරන ලද ලේඛනයන්ගෙන් සමන්විත වන බැවින් මෙම ශිලාලේඛනය ත්‍රෛභාෂා ශිලා ලේඛනය ලෙස හැඳින්වී ය. මෙහි ඇත්තේ ලංකාවේ වෙනත් බොහෝ ශිලා ලේඛනවල අඩංගු පූර්ව හෝ අපර බ්‍රාහ්මී අක්ෂර නොවේ. විශේෂයෙන් චීන අක්ෂර ප්‍රධානත්වයෙන් ලේඛනගත කිරීමෙන් එකල චීන අධිරාජ්‍යය ලංකාව තුළ දේශපාලනික, සංස්කෘතිකමය සහයෝගීතාව දියුණු කළ බව මැනවින් සනාථ වේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් මෙම අභිලේඛනය පිළිබඳ ව අධ්‍යයනය කර ඇති අතර ඒ අනුව ඔහු එහි ප්‍රමාණයන් දක්වා ඇත්තේ මෙසේ ය.

අඩි 4 ක් හා අඟල් 9 ක දිගකින් අඩි 2 ක් හා අඟල් 5 ක පමණ ඝනකමකින් ද යුක්ත ය. ශිලා පුවරුවේ ඉහළ එකිනෙකාට මුහුණ ලා සිටින මකරයින් දෙදෙනෙකි. චීන, පර්සියන් හා දෙමළ යන භාෂා තුනෙන් ම සටහන් තබා ඇත්තේ මෙම පුවරුවේ එකපැත්තක පමණි. චීන ලේඛනයට අඩි 3 අඟල් 8 X අඟල් 10 ප්‍රමාණයක් ද දෙමළ ලේඛනයට අඩි 1 අඟල් 9 x අඩි 1 හා අඟල් 3 1/2 ක ප්‍රමාණයක් ද පර්සියානු ලේඛනයට අඩි 1 අඟල් 7 x අඩි 1 හා අඟල් 4 ප්‍රමාණයක් ද අයත් වන බව ද දක්වා ඇත. මෙම සම්පූර්ණ ශිලා ලේඛනය ම මල් වැල් සහිත බෝඩරයකින් වට වී ඇත (Paranavithana 1933:331).

එකල පර්සියානු දේශවල ඉස්ලාම් ධර්මය පැතිර යාම හේතුවෙන් මෙම සෙල්ලිපියෙහි පර්සියානු කොටස අරාබි අක්ෂරවලින් ලියා ඇත. පූජා ලිපියක් වූ මෙය හින්දු දෙවිවරුන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරමින් නායනාර් (විෂ්ණු) දෙවිඳුන් පිදීම පිණිස ශ්‍රී ලංකාවට එවන ලද පූජා භාණ්ඩ රැසක් නම් කරයි.

ISSN 1800-1459



රූප සටහන 1: දැනට කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති ත්‍රෛභාෂා සෙල්ලිපිය

**ඉබන් බතූතා** සඳහන් කරන ආකාරයට යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්තී හොඳින් පර්සියානු භාෂාව කථා කළ අයෙකි (Shanmugananthan, 2006). පර්සියානු හා චීන භාෂාවන් සමඟ දෙමළ භාෂාවෙන් මෙම ලිපිය ලිවීමෙන් පෙනී යන්නේ, දෙමළ වෙළඳුන් සුලබ වශයෙන් අනෙකුත් රටවල් සමඟ සාමකාමී වෙළඳ සබඳතා පැවැත්වූ බව යි. එමෙන් ම ලිපියෙහි අඩංගු කරුණු වලින් එම රටවල සංස්කෘතින් හා භාෂා අතර, දැඩි සබඳතාවක් පැවති බව පැහැදිලි කරයි.

මෙම ශිලා ලේඛනය විවිධ පඬිවරුන් විසින් විවිධ අන්දමින් පරිවර්තනය කර ඇත. ඒවා විමසා බලන විට පැහැදිලි වනුයේ විවිධ ආකාරයෙන් කරන ලද පුද පූජා පිළිබඳ තොරතුරු ඒවායේ සඳහන් කර ඇති බව යි. මෙම ශිලා ලේඛනය **මිං** පෙළපතේ මහාධිරාජ **යුං ලෝ** ගේ නියමය පරිදි චීනයේ දී නිමකොට කෝට්ටේ දළදා සමිඳුන් වෙත පුදන ලද අනිකුත් තුටු පඬුරු සමඟ එවන ලද්දකැයි සැලකේ. චීන ජාතිකයන් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් වන්දනා කිරීම දැඩිලෙස සිදුකර ඇති අතර, විෂ්ණු දෙවියන් අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස විශ්වාස කර පුජා භාණ්ඩ එවා ඇත. මෙම පූජා භාණ්ඩ අතර රන් කලං 1000, රිදී කලං 1000, පළිඟු, තඹ වලින් කළ අඟුරු කබල් 05, කළුවර කනප්පු 10, තඹ මල් පෝච්චි 10, පිත්තල පහන් වලට වැටි කොපු 05, ඉටිපන්දම් ජෝඩු 10, තෙල් කට්ටි 2500, සඳුන් කැලි 10, රන් හුයෙන් අලංකාර කළ පළිඟු ඇල්ලූ ධජ 08 ක් හා එවැනි රතු කොඩි 02ක් ද තිබී ඇත.

මෙම ත්‍රෛභාෂා සෙල්ලිපියේ චීන භාෂාවෙන් සටහන් වී ඇති කොටසේ අදහස දළ වශයෙන් මෙසේ ය.

> "චීනයේ සිටි මිං රාජ වංශයට අයත් අධිරාජ්‍යයා විසින් චෙංහෝ නැමැත්තා සහ සෙසු පිරිස ලෝකයේ ම ගෞරවයට පාත්‍ර වූ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ තැබීම සඳහා එවා ඇත."

> "ඉතා ගැඹුරු ලෙස ඔබව අප පූජ්‍යත්වයෙන් සලකනවා, එසේම කාරුණික සහ ගෞරවනීය පුද්ගලයෙකු ලෙස ඔබගේ පාරිශුද්ධභාවය ඉතාම ගැඹුරු ය. ඔබගේ ධර්මය සියලු දෙනාට පැහැදිලි වන ලෙස දේශනාකර ඇත. ඔබගේ නීතියට සියලු ම මිනිස් වර්ගයා යටත් ය. ඔබ ජීවත්වන කාලය ගඟක ඇති වැලි කැටවලට මම සමාන කරමි. ඔබගේ සංයමය ඕනෑම පුද්ගලයෙකු අවනත කරගැනීමට මෙන් ම ආලෝකමත් කිරීමේ හැකියාව තිබෙන අතර ඔබ සතු කරුණාව ඉතා ම වේගවත් ය. මාගේ නියෝජිතයින් මා එවන්නේ මේ පිළිබඳ ව සටහන් කිරීමට හා පිටරටියන්ට මේ පිළිබඳ ව ප්‍රකාශ කිරීමට යි. ගමනාගමනයේ දී ඔබගේ ආරක්ෂාව ආශිර්වාදය ලැබේවා. මාගේ ප්‍රාර්ථනාව පරි දිම මුහුදේ දී ඇති විය හැකි සියලු ම අන්තරායන්ගෙන් බේරී නැවතත් අපේ රටට සුවසේ නිරුපද්‍රිත ව පැමිණෙත්වා. සදාකල් පවතින ඔබගේ ශ්‍රේෂ්ඨ දහමේ නාමය නිසා අපට හැකි උපරිම අන්දමින් ඔබ පුදමු. ගෞරවනීය උතුමාණෙනි, ඔබගේ ශ්‍රේෂ්ඨ නාමයට මෙම පූජාවන් පුදමි. පූජාවට රනින් හා රිදියෙන් තනන ලද වස්තූන් ඇතුළත් ය. මුතුමැණික් අල්ලන ලද තිර, ඉතා වටිනා සිල්ක් නූලෙන් වියන ලද කොඩි, සුවඳවත් මල් බඳුන්, වැඩදමන ලද වර්ණ වූ සේද රෙදි, ලාම්පු, ඉටිපන්දම් ඇතුළු වෙනත් තෑගි භාණ්ඩ සියල්ල ම ඔබගේ ශ්‍රේෂ්ඨ නාමය වෙනුවෙන් වන්දනීයත්වයෙන් පූජා කරමි" (Paranavithana, 1933:337).

ආදි වශයෙන් ලේඛනයේ සඳහන් වේ. එහි දෙමළ භාෂාවෙන් සඳහන් කරල ලද කොටසින් ද සඳහන් වන්නේ **"Thenavarai Nayanar"** දෙවියන් සඳහා කළ පූජාවක් බව යි. එහි සඳහන් වන්නේ තුටු පඬුරු හා පූජා භාණ්ඩ එම දෙවියන් උදෙසා උතුම් වූ ශ්‍රද්ධාවෙන් යුක්තව පූජා කළ බවයි (එම 1933:331-341).

එසේ ම පර්සියන් භාෂාවෙන් ලියා ඇති කොටස යම් තාක් දුරට විනාශයට පත් ව තිබෙන අතර එහි ඉතිරි වී ඇති අක්ෂර පේළි මඟින් සඳහන් වන්නේ ඉස්ලාම් ආගමේ ආලෝකය පිණිස කරන ලද පූජාවක් බව යි (එම 1933:331-341). මෙසේ ඉස්ලාම් යන වචනය ඇති බැවින් මෙම පිළිගැන්වීම අල්ලා දෙවියන් උදෙසා කළ බව නිගමනය කළ හැක. භාෂා කිහිපයකින් ලියැවී ඇති මෙම ලේඛනය මඟින් පිළිබිඹු වන්නේ විශේෂයෙන් චීන රාජ්‍යය හා අනෙකුත් විවිධ ජාතීන් ලංකාව සමඟ දේශපාලන, සංස්කෘතික සම්බන්ධතා පැවැත් වූ බව යි. විශේෂයෙන් 1911 දී සොයාගත් මෙම ත්‍රෛභාෂා සෙල්ලිපිය මඟින් චීන අධිරාජ්‍යයේ සෘජු බලපෑම ලංකා රාජ්‍යයට ලැබුණු බව නිගමනය කළ හැක. එය එසේ නොවිනි නම් මෙවන් සෙල්ලිපියක් ලංකාවෙන් හමුනොවීමට ඉඩ තිබුණි.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 237-249
ISSN 1800-1459

## ශ්‍රී ලංකාව සහ චීනය අතර වත්මන් සහයෝගීතාව

ඉන්දියන් සාගරයේ වෙළඳ නැව් මාර්ගයේ පිහිටි දූපතක් වීම ලංකාව හා චීනය අතර දියුණු වෙළඳ, දේශපාලන හා සංස්කෘතික සබඳතා බිහිවීමෙහි ලා ඉතා වැදගත් විය. අතීතයේ සිට පැවතගෙන එන එම සහයෝගීතාව ය වර්තමානය දක්වා නොකැඩී පවතින බව නොරහසකි. ඒ අනුව වර්තමානයේ දෙරට අතර මිත්‍රත්ව සහයෝගිතා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වේ. දෙරට අතර ශක්තිමත් මිත්‍රත්ව සම්බන්ධතාවන්හි වැදගත් සන්ධිස්ථාන රැසක් වේ. ඒ අතුරින්,

- වර්ෂ 1952 ශ්‍රී ලංකාව හා චීනය අතර රබර් සහල් ගිවිසුම අත්සන් කිරීම
- වර්ෂ 1957.02.07 චීනය හා ශ්‍රී ලංකාව අතර මෙතෙක් පැවති මිත්‍රත්ව සබඳතා වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇරඹීම
- වර්ෂ 1957 හිටපු චීන අගමැති **චෞ එන් ලායි** ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීම
- වර්ෂ 1961 ශ්‍රී ලංකා අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය චීනයේ සංචාරයක නිරතවීම
- වර්ෂ 1964 චීන අගමැති **චෞ එන් ලායි** ගේ දෙවන ශ්‍රී ලංකා සංචාරය
- වර්ෂ 1972 ශ්‍රී ලංකා අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ දෙවන චීන සංචාරය
- වර්ෂ 1984 ජනාධිපති ජේ. ආර් ජයවර්ධන මැතිතුමාගේ චීන සංචාරය
- වර්ෂ 1990 චීන රාජ්‍ය නායක Li Peng ගේ ශ්‍රී ලංකා සංචාරය
- වර්ෂ 2001 චීන රාජ්‍ය නායක Zhu rongji ගේ ශ්‍රී ලංකා සංචාරය
- වර්ෂ 2001 චීනය ශ්‍රී ලංකාව තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන දහතුනක් ආයෝජනය කිරීම

මේ ආකාරයේ වැදගත් සන්ධිස්ථාන රැසක් දෙරට අතර මිත්‍රත්ව සහයෝගිතාව තහවුරු කරන අතර ආසියාවේ විශාලතම වරාය බවට පත් කිරීමේ අදහසින් ඉදිවන හම්බන්තොට වරාය චීන රජයේ මූල්‍යාධාර මත ගොඩනැගේ. මෙය නැගෙනහිර හා බටහිර යා කරන නාවික ගමන් මාර්ගයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක පිහිටි හෙයින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලනික ශක්තිමත් භාවය කෙරෙහි දැඩිව බලපානු ලැබේ.

ඉතා ශක්තිමත් පදනමක් මත ගොඩනැගුණු චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය ශ්‍රී ලංකාවට වටිනා දායාද රැසක් ලබා දී ඇත. ඒ අතරින් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම, අලුත් කඩේ උසාවි සංකීර්ණය ඉදිකිරීම, රිජ්වේ ආර්යා ළමා රෝහල නැවත සංවර්ධනය කිරීම, කොළඹ ප්‍රාසාංගික කලා භවන ඉදිකිරීම, පුත්තලම ගල් අඟුරු බලාගාරය ඉදි කිරීමට සහය දැක්වීම, සූරිය වැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදි කිරීම ආදි ව්‍යාපෘතීන් වැදගත් වේ. මේ ආකාරයේ සමීප ද්විපාර්ශවික සබඳතාවක් දෙරට අතර වර්ධනය වෙමින් පවතින

චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සම්බන්ධතා හා දේශපාලන බලපෑම: ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය ඇසුරෙනි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013. සත්වැනි කලාපය. පිටු 237-249
ISSN 1800-1459

අතර ශ්‍රී ලංකාවේ වත්මන් සංවර්ධන ක්‍රියාවලියට සෘජු ලෙස චීන රජයේ ආධාර සැපයෙන බව නිගමනය කළ හැකි කරුණකි.

## නිගමනය

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ අතීතයේදී ලංකාවේ දේශපාලනයට චීන රාජ්‍යය සෘජු ලෙස සම්බන්ධ වූ බවට කරුණු විශ්ලේෂණය කිරීම යි. ඒ අනුව ප්‍රධාන වශයෙන් ක්‍රි.ව. 14, 15 වන සියවස් තුළ චීන රජය සෘජු ලෙස ශ්‍රී ලංකාවේ දේශපාලනයට සම්බන්ධ වී ඇත. චීන ජාතිකයන්ගේ සංක්‍රමණයෙන් ලක්දිව රජවරුන්ගේ බලය හා ගෞරවය තහවුරු කරගැනීමේ අවස්ථාව ලැබුණි. ප්‍රධාන වශයෙන් ගම්පළ, රයිගම හා කෝට්ටේ දේශපාලන තත්ත්වය අවුල් සහගතව පැවති අවධියේ එකල සිටි චීන අධිරාජ්‍යයවරයාගේ මැදිහත් වීම සහ ඔවුන්ගේ බල ව්‍යාප්තිය මගින් ලංකාවේ දේශපාලන තත්ත්වය ස්ථාවර බවට පත්විය. ලක්දිව පාලකයන් චීනයට අල්ලාගෙන යෑම වැනි සුවිශේෂ අවස්ථා නිසා චීනයේ බලය ලක් වැසියන් තුළ බලවත් හැඟීමක් පහල කිරීමට සමත්විය. යුග ගණනාවකින් පසුව කෝට්ටේ ස්ථාවර රාජ්‍යයක් බිහි වූයේ චීන රාජ්‍යය නිසා ය. ත්‍රෛභාෂා සෙල්ලිපිය පිහිටුවීමෙන් පසු වරින් වර චීන දූතයෝ ලක්දිවට පැමිණ දේශපාලන ස්ථාවරත්වයක් රට තුළ ඇති කළහ. මිං පෙළපතේ යුංලෝ අධිරාජ්‍යයාගේ ප්‍රධාන අරමුණ වූයේ අවට රාජ්‍යවල ස්වකීය අධිරාජ බලය පැතිරවීම ය. ශ්‍රී ලංකාව තුළ එම කාලයේ පැවති අස්ථාවරභාවයන් සමඟ ඔහුගේ එම අභිප්‍රාය ඉතා පහසුවෙන් ඉටු කරගැනීමට අවස්ථාව සැලසුන බව නිගමනය කළ හැකි ය.

චීනය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව ක්‍රි.ව. 1 වන සියවසටත් වඩා අතීතයට දිව යයි. දෙරට අතර සමාජීය, දේශපාලනික, සංස්කෘතික සහයෝගිතාව තහවුරු කරන පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාධක ගණනාවක් දැනටමත් අනාවරණය කරගෙන ඇත. ඒ අතුරින් හඳුනාගත් ප්‍රධාන සාක්ෂියක් ලෙස ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය හඳුන්වා දිය හැකි ය. ක්‍රි.ව. 14 සහ 15 වන සියවස් තුළ අලකේශ්වර පරපුරේ විවිධ හැලහැප්පීම් මත ලංකාවේ තිබූ අවුල් සහගත දේශපාලන වාතාවරණය නිමා කරමින් දේශපාලන ස්ථාවරත්වයට පත් වූයේ චීන අධිරාජ්‍යයේ බලපෑම හේතුවෙනි. මේ ආකාරයට වර්තමානය දක්වා ඉතා දිගු සබඳියාවකින් දෙරට අතර දේශාපලන, සංස්කෘතික හා ආගමික සහයෝගීතාව තහවුරු වෙමින් පවතියි. ලංකාවේ වත්මන් සංවර්ධිත ක්‍රියාවලියට ද සෘජු දායකත්වය සපයමින් වර්තමානයේ චීන රජය ශ්‍රී ලංකාව සමඟ අතිජාත මිත්‍රයෙකු මෙන් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කරමින් ඉදිරියට ගමන් කරයි.

## පරිශීලිත මූලාශ්‍රය

ඒකනායක, ඇකිරියගල එච්.ඒ. (2008) *අපේ ශිෂ්ටාචාරය 4* (කෝට්ටේ යුගය), කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

කහඳව ආරච්චි, චන්ද්‍රදාස (1995) *ලංකා ඉතිහාසයේ විකාශනය* (ක්‍රි.පූ. 6 සියවස සිට ක්‍රි.ව. 1978 දක්වා) කොළඹ, සමයවර්ධන පොත්හල.

කොඩ්රිටෙන්, එච්.ඩබ්. (1957) *සංක්ෂිප්ත ලංකා ඉතිහාසය*, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

කෞතුකාගාර - 2008 *සාහිත්‍ය විශේෂ කලාපය*, කොළඹ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

ගමගේ, එස්.අයි. (2007) *කෝට්ටේ යුගය - දේශපාලන, සමාජ හා සංස්කෘතික පසුබිම*, මුදුන්ගොඩ, තරංග ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, වී.ඩී.එන්.එස්. (2003) *සෙල්ලිපි වලින් හෙළි කරන ශ්‍රී ලංකා ඉතිහාසය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දසනායක, සුමනසිරි. (2005) *කෝට්ටේ හා සීතාවක යුග*, දන්කොටුව, වාසනා ප්‍රකාශකයෝ.

පරණවිතාන, ඇස්. (1971) II පරිච්ඡේදය, *ගංපළ සහ රයිගම*, *III* පරිච්ඡේදය, 1505 දක්වා කෝට්ටේ රාජ්‍යය, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය මුද්‍රණාලය.

පරණවිතාන, කේ.ඩී. (1991) *ගාලු පුරාණය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණදීර, මැන්දිස්. (1995) *දේශපාලන ඉතිහාසය- ක්‍රි.ව 1271-1509, ශ්‍රී ලංකාවේ ඉතිහාසය (දෙවන කොටස) පොළොන්නරු යුගය - කෝට්ටේ යුගය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වනරතන හිමි, කඹුරුපිටියේ (1994) *මාතර පුරාවිද්‍යාත්මක ඉතිහාසය*, කොළඹ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

*Inscriptions of Ceylon, Vol VIII, Archeological Survey of Ceylon*, (2007), The Department of Archeology, Sri Lanka.

*Journal of the Ceylon Branch of the Royal Asiatic Society* - Vol XXIV, XXVIII (J.R.A.S.C.B.)

Paranavithana, S (1933), "The Tamil Inscription on the Galle Trilingual SLAB", *Epigraphia Zeylanica*, Vol III - pp 331 - 341, Archaelogical Survery of Ceylon.

Peris, Kamalika (2008), *Diplomacy in Ancient and Medieval Sri Lanka*,

*www.lankalibrary.com/phpBB/viewtopic.php?f=19&t=4556,Accessed on 8th of July 2010.*

Shanmugananthan, R (2006), Medieval Traveller Ibn Battuta was a Guest of the Jaffna King in 1344,

*http://www.sangam.org/taraki/articles/2006/02-26_Ibn_Battuta_Jaffna_Kingdom.php?uid=1547*

*www.archive.org/stream/spoliazeylanica09nati/spoliazeylanica09nati_djvu.txt , Accessed on 4th August 2010 .*

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

## සත්වැනි කලාපය - 2013 ජනවාරි


සාරිය: සංඥදර්ථවේදී ප්‍රවේශයක්

සුලාරි ද සිල්වා 1-30

නිල්වලා ගඟ ආශ්‍රිත ජනකවි

ධම්මික හේවගේ 31-48

පුවක් ගස හා බැඳි ජන සංස්කෘතිය

එම් එස් එම් එල් කරුණාරත්න 49-79

සමකාලීන සිංහලයේ යෙදෙන සර්ග

තරිඳු නුවන් ජයතිස්ස 80-95

පරිසර පිරිහීම් සහ ගෝලීය පරිභෝජනයේ යථාර්ථය: පරිසර සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

සුසන්ත රස්නායක සහ ප්‍රදීප් උළුවඩුගේ 96-115

භාරතීය කාව්‍ය ශාස්ත්‍රයෙහි එන අලංකාර නූතන ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යවල භාවිතය:
තෝරාගත් අලංකාර සහ රූපවාහිනී මාධ්‍යයෙන් තෝරාගත් වෙළඳ දැන්වීම් කිහිපයක් ඇසුරිනි

සංගීත් රත්නායක 116-123

යටත්විජිත ධනේෂ්වරයේ නැගීම හා සමාජ සංචලතාව
(කුණ්ඩාවාඩය නවකතාව ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්)

චම්පා එස් ද සිල්වා 124-135

තොරතුරු සාක්ෂරතාව, එහි ඓතිහාසික වර්ධනය සහ තත් විෂයෙහි ජාතික
අධ්‍යාපන ප්‍රතිපත්තියක අවශ්‍යතාව: ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විමසුමක්

ලලිත් වික්‍රමනායක 136-154

වාණිජ අවකාශයේ දළදා තේවාව: සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක්

සුසන්ත රස්නායක, සමන් හඳරාගම හා ඉන්දිකා අබේරත්න 155-174

ස්ත්‍රීවාදය: තත්කාලීන ශ්‍රී ලාංකේය ස්ත්‍රීවාදීන් මුහුණ දෙන අභියෝග

චන්දිමා ජයසේන 175-197

කුඩා වැව් ප්‍රතිසංස්කරණයේ දී ප්‍රමුඛතාව හඳුනා ගැනීම සඳහා සහභාගිත්ව
ග්‍රාමීය පිවිසුම් ක්‍රමවේද භාවිතය (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

කේ පී එල් නිශාන්ත පටබැඳි 198-212

දේශීය අධිකරණ බලය තුළ අන්තර්ජාතික නීතියේ අදාළත්වය: ශ්‍රී ලංකාව ඇසුරින් අධ්‍යයනයක්

ප්‍රදීප් උළුවඩුගේ, එච්. රංජිත් සහ ජී. සී. එල්. පතිරණ 213-226

සොකරි නාටකයෙහි අන්තර්ගත යාතුකර්ම ලක්ෂණ

කේ. ජී. අමරසේකර 227-236

චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සම්බන්ධතා හා දේශපාලන බලපෑම:
ගාල්ලේ ත්‍රෛභාෂා සෙල්ලිපිය ඇසුරෙනි

එස්. නිමාලි ප්‍රියංගිකා 237-249



*ISSN:* 1800 - 1459

# National Digitization Project

## *National Science Foundation*

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : 2017-10-02
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : S. A. C Sadaruwan

Signature : ..............................

**Certification of Scanning**

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

**Certifying Officer**

Designation : LIBRARIAN

Name : T.N. NEIGHSOOREI

Signature : ..............................

Mr REI

Sab of Sri Lanka

anka

Date : 2017-10-02

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*